## සංචාරක මණ්ඩලයේ රාමායණ සංචාරය පිළිබඳ විස්තරය

**ගැස්ටන් පෙරේරා**

මේ ඉදිරිපත් කිරීමෙන් ඔප්පු කරන්න හදන්නේ රාමායණ නැමැති මිථ්‍යා කථාව සංචාරක අමාත්‍යාංශය විසින් ඉන්දියානු සංචාරකයනින් මෙහි කැඳවා ගැනීමට කරන ලද ප්‍රයත්නයකි. මෙය සාධාරණ (පැති නොගෙන) මෙය සත්‍යාතාව පහදා දීමට සංචාරක අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් සහ  දරන ලද ප්‍රයත්නයේ සත්‍ය අසත්‍ය බව පෙන්වා දීමට ය.

කලින් තිබූ සංචාරක මණ්ඩලය වෙනුවට ස්ථාපිත SLTDA විසින් අඩු වී යන සංචාරකයන් ගෙන්වා ගැනීමට දරණ ප්‍රයත්නයක මේ රාමායණ කථාව ප්‍රබන්ධ කර ගෙන ඇත. අප රටේ දරුණු යුද්ධයක් පැවතීම නිසා ගෝලීය මුදල හිඟකම ආදිය සාධක වී ඇතත් මේ ගැන ඉන්දීය බුද්ධිමත් බලධාරීන් ද මෙය ප්‍රතික්ෂේප කරයි. ඔවුන් රාමායණ මිත්‍යා කථාවත් ලංකාවත් අතර තිබෙන සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කරති.  හඳුන්වා දීමෙන් අප රටට කැලලක් මිස හොඳක් නැත. සංචාරක  නම් කර ඇත්තේ Trail of Sita නමින් ය. රාමායණ කථාව විස්තර කර ඇත්තේ Victory of good over evil රාම හඳුන්වන්නේ ඉතාම ලක්ෂණ කුමාරයෙක් ලෙස ය. රාවණ හඳුන්වන්නේ යක්ෂ රජෙක් ලෙස ය.

SLTDA හි ප්‍රයත්නය නම් ස්ථාන 50 ක විස්තර රාමායන කථාව ආශ්‍රිත ඒව හැටියට දැක්වීමයි. ඒවා කිහිපයක් සඳහන් කර ඇත. ඔවුන් අතරින් රාවණ ඇල්ල ගුහාව රාවණාගේ විශ්ෂ්ට දක්ෂතම පොලව යට ගුහා සංකීර්ණයක් ගැන විස්තර වේ. සීතා ඇගේ පිරිසිදුභාවය ඔප්පු කළ දිව්රුම්පොල ද වේ. මේ දිව්රුම්පොල ගැන කියන්නේ ඕන කෙනෙක් එහි දිව්රුම් දුන්නොත් එය ලංකාවේ ඕනෑම උසාවියක් පිලිගන්නා බවය.

ඒ හැර SLTDA  මගින් කමිටුවක් පත් කර ඇත. එය රාමායණ සංචාරක පාලක කමිටුව නමින් හැඳින්වේ. කාර්යභාරය ලෙස රාමයණය ගැන පර්යේෂණය කරනු ඇත. මේ කමිටුව එක් වගකීමක් වන්නේ රාමායණ කථාවට තුඩු දෙන යම් දේ සොයා ගැනීමය. මෙතෙක් කල් සොයා ගෙන ඇත්තේ පොලොන්නරුවේ පොත්ගුල් වෙහෙරේ පරාක්‍රමබාහු යැයි සැක කරන විශ්මිත ගල්රුව රාවණාගේ මුත්තාවන පුලස්තිගේ යයි සාක්ෂි ඇති බවත් නිගමනයට බැස ඇත්තේ ඔහුගේ පපුව හරහා දමා ඇති පූණ නූල නිසාය. රාමායණ සහ ලංකාව අතර සම්බන්ධතාවය ගැන කමිටු සභාපති විසින් ප්‍රසිද්ධියේ කියා ඇත්තේ ඉන්දීය  මූලාස්ථානයේ කරන ලද රාමායන හා රාවණ අතර ලංකාවට ඇති සම්බන්ධතාවය විග්‍රහ කරමිනි. මේ සමානව ඇති පුරා විද්‍යාව ඉතිහාසය ශිලා ලේඛන ආදිය ප්‍රතික්ෂේප කරමිනි.